# දරුවන් උදෙසා බයිබලයක්

# උතුම් ගුරුවරයාණන් වූ ජේසුස් වහන්සේ



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Byron Unger; Lazarus Alastair Paterson

සකස්කරන්නා: E. Frischbutter; Sarah S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.



ජේසුස් වහන්සේ ශ්‍රේෂ්ඨ
ගුරුවරයෙකු වූ සේක. උන්වහන්සේ
ශ්‍රේෂ්ඨතම වූ සේක. ජනතාව
උන්වහන්සේට ඇහුම්කන්
දුන්නෝය.



ජේසුස් වහන්සේ ඔවුන්ට දයාවන්ත, යහපත් සහ කරුණාවන්ත වන්නට කී සේක. අනෙක් මිනිසුන් ඔවුන්ට වෛර කර රිදෙව්වද දෙවියන් වහන්සේ ඔවුන්ව රැකබලා ගන්නා සේක.



ජේසුස් වහන්සේ
බොහෝ දේ ඉගැන්වූ
සේක. දෙවියන්
වහන්සේගේ ජනතාව
පහනකින් නිවසක්
ආලෝකවත් කරන්නා
සේ ලෝකය
ආලෝකවත් කරන
බව උන්වහන්සේ කී
සේක. කළුවර
කාමරයක පහනක්
දැල්වූ විට මොනතරම්
වෙනසක් සිදුවේද?

“ඇසට ඇසක්, දතට දතක්” ලෙස
මිනිස්සු පළිගැනීම ගැන විශ්වාස
කරගෙන සිටියෝය. නමුත් ජේසුස්
වහන්සේ සතුරන්ට පවා
කරුණාව දක්වා,
සමාව දී ආදරය
කිරීමට
ඉගැන්වූ
සේක.




ජේසුස් වහන්සේගේ කාලයේදී සමහර මිනිස්සු තමුන් ශුද්ධවන්තයන් ලෙස පෙන්වන්නට ආශා කළෝය. ඔවුන් යාචකයන්ට මුදල් දෙද්දී සියලු දෙනා ඒ දෙස බලනු පිණිස ඔවුන්ගේ මිනිසෙක් හොරණෑවක් පිම්බේය. “ඔබේ දීමනා රහසින් දෙන්න, එවිට දෙවියන් වහන්සේ ඔබට යහපත් විපාක දෙනසේකැ”
යි ජේසුස්
වහන්සේ
කී සේක.

ජේසුස් වහන්සේ යාච්ඤා කිරීම ගැනද එලෙසින්ම ඉගැන්වූ සේක. සමහර මිනිස්සු හැමෝටම පෙනෙන හා ඇසෙන පිණිස මිනිසුන්ගෙන් පිරුණු හන්දි වල හිඳ යාච්ඤා කළෝය. ඔවුන්ට දෙවියන් වහන්සේ ගැන සැළකිල්ලක් නොවීය. ඔවුන් සැළකිලිමත් වුණේ අනෙක් අය තමුන් ගැන සිතන අකාරය ගැනය. ජේසුස් වහන්සේ ඔවුන් අවංක නැති වංචාකාර රඟපාන්නන් ලෙස හැදින්වූ සේක.



ජේසුස් වහන්සේ බොහෝ විට තමන් වහන්සේගේ ඉගැන්වීම් පැහැදිලි කරන්නට ස්වභාව ධර්මය යොදාගත් සේක. උදාහරණයක් ලෙස උන්වහන්සේ කුරුල්ලන් දෙසට මිනිසුන්ගේ අවධානය යොමු කළ සේක. “ස්වර්ගයේ සිටින ඔබේ පියාණන් මේ කුරුල්ලන්ටද අහාර දෙන සේකැ” යි උන්වහන්සේ කී සේක. “කරදර නොවන්න, දෙවියන් වහන්සේ ඔබවද පෝෂණය කරන සේක”.



“ධනවත් සලමොන් රජ පවා මේ මානෙල් මල් තරම් ලස්සනට හැඳ පැලඳ සිටියේ නැතැ” යි ජේසුස් වහන්සේ තව දුරටත් පැවසූ සේක. “දෙවියන් වහන්සේ තණබිම් වල වැඩෙන තණකොළ පවා සරසන්නේනම් උන්වහන්සේ ඔබව ඇඳුමින් සරසන්නේ නැතිද?” ජේසුස් වහන්සේ අපගේ අවශ්‍යතා වලදී අපට සපයන දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාස කරන්නට මිනිසුන්ට ඉගැන්වූ සේක.



“ඔබ ඔබේ සහෝදරයා විනිශ්චය කරන්නේනම්,
එය ඔබගේ ඇසේ විශාල ලී කොටයක් තිබෙද්දී
ඔහුගේ ඇසේ තිබෙන කුඩා ලී කුඩ
ඉවත් කරන්නට උත්සහ
කරනවා හා සමානයැ”
යි ජේසුස් වහන්සේ කී
සේක. සමහරවිට
මිනිසුන් සිනාසෙන්නට
ඇත. නමුත් ඔවුන්
උන්වහන්සේ පැවසූ
කාරණාවේ ඇති
අර්ථය තේරුම්
ගත යුතුය.





මිනිසුන් දෙවියන් වහන්සේගෙන් පිහිට
යැදිය යුතු බව ජේසුස් වහන්සේ කී සේක.
පොළොවේ සිටින්නාවූ පියවරු තමන්ගේ
කුසගින්නේ සිටින දරුවන් රොටි ඉල්ලූ විට ගල්
කැටයක් දේවිද? නැත! ඔවුන් යහපත් දේ දෙනු
ඇත. දෙවියන් වහන්සේද උන්වහන්සේගෙන්
ඉල්ලන්නන්ට යහපත්
දේ දෙන සේක.

ශ්‍රේෂ්ඨ ගුරුවරයාණන් වූ ජේසුස් වහන්සේ බොරු ගුරුවරුන් ගැන අවවාද දුන් සේක. “ඔවුන් බැටළුවන් මෙන් හැඳ සිටිති” යි ජේසුස් වහන්සේ කී සේක. “නමුත් ඇතුළතින් ඔවුහු වෘකයෝය” බොරු ගුරුවරුන් ඔවුන් ගත කරන ජීවිත වලින් හඳුනාගත හැකි බව උන්වහන්සේ කී සේක.



උන්වහන්සේ පැවසූ එක් කතාන්දරයක් තුළින් ජේසුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ වචනයට කීකරු වන මිනිසුන් ගලක් මත තම නිවස සාදාගත් මිනිසෙකුට සමාන බව පෙන්වා දුන් සේක. බිහිසුණු කුණාටුවක් ඇතිවිය. එය අවසන් වූ පසුත් ඒ නිවස නොසෙල්වී තිබුණේය.



නමුත් අනුවණ මිනිසා ඔහුගේ නිවස වැලි මත ඉදි කළේය. කුණාටුව එයට හැමූ විට එහි අත්තිවාරම දුර්වල නිසා ගෙය කඩාගෙන වැටුණේය. දෙවියන් වහන්සේගේ වචනයට කීකරු නොවන මිනිසුන් ඒ මිනිසා හා සමාන බව ජේසුස් වහන්සේ කී සේක.



ජනතාව ජේසුස් වහන්සේගේ වචන ගැන පුදුම
වූවෝය. ඔවුන් කලින් එවැනි දේවල් අසා තිබුණේ
නැත. දැන් ඔවුහු දෙවියන් වහන්සේගේ වචනය
ඇසීම පමණක් ප්‍රමාණවත් නැති බව
දැනගත්තෝය. ඔවුන් ඊට සෑම
දිනකම කීකරු විය යුතුය.



උතුම් ගුරුවරයාණන් වූ ජේසුස් වහන්සේ

# දේව වචනයෙන් එක් කථාවක්

# බයිබලයේ

ශු. මතෙව් 5 -7, ශු. ලූක් 6

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)